**ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 24 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම්**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4,565.25 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 4,061.13 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 504.12 ක් හෙවත් සියයට 11.04 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 2,879.20 | 2,841.16 | 38.04 | 1.32 |
| මූලධන | 1,686.05 | 1,219.97 | 466.08 | 27.64 |
| **එකතුව** | **4,565.25** | **4,061.13** | **504.12** | **11.04** |

## 2.2 ආදායම් ගිණුම්

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත 35 ක් සඳහා එකතුව රු.මිලියන 573,115 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 604,252.57 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 105.43 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | මුල් ආදායම් ඇස්තමේන්තුගත ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට | | | වැඩි වීම/(අඩු වීම) සංශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර විචලනය වැඩි වීම/(අඩු වීම) | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10-02-01-01 | 42,000.00 | 35,000.00 | 36,096.75 | 1,096.75 | 3.13 |
| 10-02-01-02 | 92,000.00 | 85,000.00 | 96,605.62 | 11,605.62 | 13.65 |
| 10-02-01-03 | 31,000.00 | 55,000.00 | 35,412.91 | (19,587.09) | (35.61) |
| 10-02-01-04 | 75,000.00 | 95,000.00 | 115,336.24 | 20,336.24 | 21.41 |
| 10-02-02-01 | - | - | 1.20 | 1.20 | 100.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10-02-02-02 | - | - | 0.38 | 0.38 | 100.00 |
| 10-02-02-03 | - | - | - | - | - |
| 10-02-03-01 | - | - | 8.09 | 8.09 | 100.00 |
| 10-02-03-02 | - | - | - | - | - |
| 10-02-03-03 | - | - | - | - | - |
| 10-02-08-00 | - | - | - | - | - |
| 10-02-09-00 | - | - | 16.64 | 16.64 | 100.00 |
| 10-03-03-00 | 3,000.00 | 900.00 | 1,884.50 | 984.50 | 109.39 |
| 10-03-04-00 | - | 1,900.00 | 737.66 | (1,162.34) | (61.18) |
| 10-03-05-00 | - | 250.00 | 258.80 | 8.80 | 3.52 |
| 10-03-07-10 | 8,000.00 | 750.00 | 1,579.13 | 829.13 | 110.55 |
| 10-02-12-01 | 55,000.00 | 22,000.00 | 29,120.40 | 7,120.40 | 32.37 |
| 10-02-12-02 | 30,000.00 | 12,000.00 | 9,908.50 | (2,091.50) | (17.43) |
| 10-02-12-03 | 50,000.00 | 20,000.00 | 18,395.24 | (1,604.76) | (8.02) |
| 10-04-01-02 | 14,000.00 | 14,000.00 | 15,901.81 | 1,901.81 | 13.58 |
| 10-04-04-00 | 15,000.00 | 21,000.00 | 20,458.18 | (541.82) | (2.58) |
| 10-03-10-00 | - | 15.00 | 11.05 | (3.95) | (26.30) |
| 10-04-01-01 | 114,000.00 | 105,000.00 | 121,836.21 | 16,836.21 | 16.03 |
| 10-04-02-01 | 26,000.00 | 28,000.00 | 28,169.49 | 169.49 | 0.61 |
| 10-04-03-01 | 62,000.00 | 60,000.00 | 47,839.32 | (12,160.68) | (20.27) |
| 10-04-03-99 | 500.00 | 300.00 | 8,066.53 | 7,766.53 | 2,588.84 |
| 10-04-01-04 | 2,000.00 | - | - | - | - |
| 10-04-02-99 | 18,000.00 | 15,000.00 | | (4,810.48) | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 10,189.52 | | (32.07) |
| 10-04-01-03 | 200.00 | 2,000.00 | 6,395.74 | 4,395.74 | 219.79 |
| 20-06-03-00 | - | - | - | - | - |
| 10-03-09-00 | - | - | 22.67 | 22.67 | 100.00 |
| එකතුව | 637,700.00 | 573,115.00 | 604,252.57 | 31,137.57 | 5.43 |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂයය අංක 24601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 105.00 | 81.43 | 65.00 | 82.88 | 400.00 | 328.09 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ අංක 7002/0000/00/0069/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 5 ක් වූ අතර එම ශේෂය 2017 ජනවාරි 18 දින පියවා තිබුණි.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පතු ගිණුම් 7 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂයන්ගේ එකතුව රු.මිලියන 994.21 ක් විය. විස්තර පහත දැක්වේ.

| **ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
| --- | --- |
| | **රු.** |
| 6000/0000/00/0001/0039/000 | 683,422 |
| 6000/0000/00/0002/0052/000 | 405,700 |
| 6000/0000/00/0006/0085/000 | 23,839,455 |
| 6000/0000/00/0016/0004/000 | 26,669,579 |
| 6000/0000/00/0018/0005/000 | 92,273 |
| 6000/0000/00/0019/0010/000 | 30,444 |
| 6000/0000/00/0014/0003/000 | 942,484,969 |
| **එකතුව** | **994,205,842** |

## 2.6 විගණන නිරීක්ෂණය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් සහ සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙලකර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| (අ) බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ආ) පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 3.2 විසර්ජන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50 (ii) හි උපදෙස් පරිදි ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු විය. එහෙත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම් ඇස්තමේන්තුව රු.මිලියන 3,527 ක් වුවද පසුව අනුමත කර ගෙන ඇති රු.මිලියන 1,038 ක පරිපූරක ප්‍රතිපාදන හේතුවෙන් ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4,565 ක් දක්වා සියයට 29 කින් වැඩිකර ගෙන තිබුණි. ඒ අනුව, වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කර තිබෙන බව නිරීක්ෂණය නොවීය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 27.64 ක් ද මුළු ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් සියයට 1.32 ක්ද වශයෙන් සමස්ත ප්‍රතිපාදනයෙන් සියයට 11.04 ක ඉතිරිවීම් පැවතුනි. තවද, වැය විෂයන් 09 කට අදාළව සියයට 10 සිට සියයට 55 දක්වා වූ පරාසයක ඉතිරිවීම් විය. ඒ අනුව, ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතුකර තිබුණ බවක්ද නිරීක්ෂණය නොවීය.

(ඇ) වැය විෂයන් 04 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලට අමතරව පරිපූරක ප්‍රතිපාදන මඟින් හා මුදල් රෙගුලාසි 66 මාරුකිරීම්වලින් වෙන්කල එකතුව රු.මිලියන 699.10 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 483.25 ක් ඉතිරි වී තිබුණ අතර එය අතිරේකව වෙන්කරගත් ප්‍රතිපාදනවලින් සියයට 69 ක් විය. ඒ අනුව අමතරව ලබාගත් ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර නොතිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 09 දිනැති හා අංක 252/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව 2016 වර්ෂයේ සිට විසර්ජන ගිණුමට අමතරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය යනාදී ප්‍රකාශ පිළියෙළ කර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතුවුවත් දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ දී දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණ කොන්ත්‍රාත්තුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලබා දී තිබුණි. 2015 වර්ෂයේ දී එම කොන්ත්‍රාත්තුව නිමකිරීම ප්‍රමාද කිරීම නිසා අයකළ රු.මිලියන 1.34 ක ප්‍රමාද ගාස්තු රජයේ ආදායමට බැර නොකර 2017 අප්‍රේල් 30 දින වනවිටත් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් රැස්කළ මුද්දර බදු ආදායමෙන් පළාත් සභා වෙත ප්‍රේෂණය කළයුතු රු.මිලියන 942.48 ක මුදලක් අදාළ පළාත් සභා වෙත ප්‍රේෂණය නොකර 2017 අප්‍රේල් 30 දින වනවිටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.4 ආදායම් ගිණුම්

-----------------

දෙපාර්තමේන්තු ප්‍රධානියාට ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත 35 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස් කිරීම, ගිණුම් ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදුකළ නියැදි විගණනයේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මූලික ආදායම් ඇස්තමේන්තුවට සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට ඇතුළත් කිරීම සඳහා පිළිවෙළින් රු.මිලියන 661,011 ක හා රු.මිලියන 632,241 ක ඇස්තමේන්තු ගත අගයන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. එසේ වුවද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 637,700 ක් ලෙස හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 573,115 ක් ලෙස සංශෝධනය කිරීමට කටයුතු කර තිබුණි. මේ අයුරින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් ඇස්තමේන්තු අගයන් වෙනස් කිරීමට පදනම් වූ කරුණු හා එම කරුණුවල බලපෑම ප්‍රමාණනයකර විගණනයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක පැහැදිලි කිරීමක් සිදුකර නොතිබුණි.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර රු.මිලියන 64,585 ක වෙනසක් වූයෙන් එම වෙනසට සමාන අගයකින් ජාතික අයවැය සම්පාදනයේ දී රාජ්‍ය ආදායම වැඩියෙන් තක්සේරු වීමත්, ඒ හේතුවෙන් අයවැය හිඟය එම ප්‍රමාණයෙන් අඩුවෙන් තක්සේරු වීමත් සිදුවී තිබුණු බව නිරීක්ෂණය වේ. තවද, තථ්‍ය ආදායම රු.මිලියන 604,252 ක් වූයෙන් මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් ලබා දී ඇති රු.මිලියන 637,700 ක ඉලක්ක ගත ආදායම රැස්කිරීම වෙනුවට රැස්කර ගතහැකි ආදායමට අනුරූපවන පරිදි සමාලෝචිත වර්ෂයතුළදී මූලික ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කරගෙන තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම් රැස් කිරීම රු.මිලියන 604,252 ක් විය. එය මූලික හා සංශෝධිත ඇස්තමේන්තුවලින් පිළිවෙළින් සියයට 95 ක් හා සියයට 105 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. මිලියන 79,418 ක හෙවත් සියයට 15 ක වර්ධනයක් විය. මෙම ආදායමේ වර්ධනය සඳහා එකතු කළ අගය මත බදු (VAT) හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) යන වක්‍ර බදු මූලාශ්‍ර දෙකේ සිදු වී තිබුණු රු.මිලියන 82,700 ක වර්ධනය මූලික වශයෙන් බලපා තිබුණි. එහෙත් සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු (IT) සහ රඳවා ගැනීමේ බදු (පොළී) වැනි සෘජු බදු මඟින් රැස් කළ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 33,396 කින් පහළ ගොස් තිබුණ බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ හිඟ බදු වාර්තාව සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) හිඟ ආදායම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. මිලියන 295,296 ක හිඟ බදු හා දඩ ආදායම් පැවතියද ඉදිරිපත්කළ ආදායම් ගිණුම් 35 හි ඩී.ජී.එස්.ඒ. ආදායම් -2 ආකෘතියේ අනු අංක 8 සිට 14 දක්වා දැක්විය යුතු හිඟ ආදායම් පිළිබඳ විස්තර කිසිවක් දක්වා නොතිබුණි.

(ii) ඉහත හිඟ බදු හා දඩ මුදලින් රු.මිලියන 28,878 ක් එනම් මුළු හිඟයෙන් සියයට 9.8 ක් පමණක් අයකර ගතහැකි බවත් ඉතිරි රු. මිලියන 266,418 ක මුදල එනම් මුළු හිඟයෙන් සියයට 90.2 ක ප්‍රමාණය වන හිඟ බදු හා දඩ මුදල් අය කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති බවත් වාර්තා කර තිබුණි. එසේ අය කිරීම් තාවකාලිකව අත් හිටවීමට බලපෑ හේතූන් හා අත් හිටවා ඇති බදු ශේෂ කිහිපයක් පිළිබඳ විස්තර පහතවේ.

| **අයකිරීම් තාවකාලිකව අත්හිටවීමට බලපෑ හේතූන්** | **හිඟ බදු ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| බදු අභියාචනා | 120,636 |
| අධිකරණ ක්‍රියා මාර්ග ගෙන තිබීම | 2,894 |
| විරෝධතා දැක්වීම් | 18,838 |
| පරිගණක පද්ධති දෝෂ හා වෙනත් හේතු | 66,870 |

ඒ අනුව, විරෝධතා දැක්වීම්, පරිගණක පද්ධති දෝෂ හා වෙනත් හේතු ලෙස දක්වමින් අය කිරීම් තාවකාලිකව අත්හිටුවා ඇති එකතුව රු.මිලියන 85,708 ක ශේෂ නිරවුල් කිරීමේ හැකියාව පැවතිය ද එම ශේෂ නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(iii) භාණ්ඩ හා සේවා මත හිඟ බදු රු.මිලියන 1,949 ක් පැවතුනි. ඒ සඳහා කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණ අතර එම හිඟ බදු ශේෂය සඳහා විස්තර ලේඛන ගත වී නොමැති බව නිරීක්ෂණය විය.

(iv) අවලංගු කරන ලද බදු පනත් 08 කට අදාළව සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී රු.මිලියන 8,134 ක හිඟ ශේෂයක් පැවති අතර එම මුදලින් රු.මිලියන 7,530 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නිරවුල් වී නොතිබුණි.

(ඇ) අංක 1002-01-00 දරන එකතු කිරීමේ අගය මත බදු පාලන ගිණුමට අදාළව භාණ්ඩාගාරයේ දැක්වෙන ආදායමට වඩා දෙපාර්තමේන්තු වාර්තා අනුව ආදායම රු.මිලියන 178.16 කින් වැඩියෙන් දක්වා තිබුණි. එම වෙනසට අදාළ හේතු හඳුනා ගැනීමට කටයුතු කිරීමෙන් තොරව එම මුදල ආදායම් සංකේත අංක 1002.01.02 හි ආදායමින් ආපසු ගෙවීම් ලෙස (Refund) අඩු කර දක්වා තිබුණ අතර ඉකුත් වර්ෂයේ දී එසේ අඩු කරන ලද මුදල රු. මිලියන 203.70 ක් විය.

(ඉ) 2015 ඔක්තෝබර් 30 දිනැති 2015 අංක 10 දරන මුදල් පනත මඟින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට පවරා ඇති කැසිනෝ කර්මාන්ත අය බද්ද, මන්දිර බද්ද සහ විගමනික බද්දට අදාළ බදු ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත වේ.

(i) පනතේ විධි විධාන ප්‍රකාරව 2015 නොවැම්බර් 15 දින හෝ ඊට පෙර එක් ආයතනයකින් රු.මිලියන 1,000 බැගින් කැසිනෝ ව්‍යාපාර 04 කින් එකතුව රු.මිලියන 4,000 ක කැසිනෝ

කර්මාන්ත අයබදු රැස් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඉන් රු.මිලියන 400 ක් පමණක් රැස් කර ගෙන තිබුණි. ඒ අනුව, තවදුරටත් අයවිය යුතු රු.මිලියන 3,600 ක මුදල සමාලෝචිත වර්ෂයේ දී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර ඒවා හිඟ බදු ලෙස වාර්තා කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ii) 2015 අප්‍රේල් 01 දින හෝ එදිනෙන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහාම 2000 අප්‍රේල් 01 දින හෝ ඉන් පසුව ඉදිකරනලද මන්දිරයක සෑම අයිතිකරුවකුගෙන්ම රු.මිලියන එකක මන්දිර බද්දක් අය කළ යුතු වුවත්, පනතේ 25 වගන්තියේ (4) උප වගන්තිය ප්‍රකාරව එම විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළ නියෝග සකස් වී නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේදීද කිසිදු අයකිරීමක් සිදුකර නොතිබුණි.

(iii) 2015 නොවැම්බර් 01 දින සිට බල පැවැත්වෙන පරිදි ස්ථිරවම දිවයින හැර යන සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුගෙන්ම එම පුරවැසියාට රටින් පිටතට ගෙනයාම සඳහා නිදහස් කරන ලද විදේශ විනිමය මත සියයට විස්සක අනු ප්‍රමාණයකට විගමන බද්දක් අය කිරීමේ විධිවිධාන පනවා ඇති අතර සමාලෝචිත වර්ෂයේදී එසේ විගමන බද්ද ලෙස රු.මිලියන 11 ක් පමණක් රැස් කර තිබුණි. එහෙත් ආගමන විගමන දෙපාර්තමේන්තුව සහ විනිමය පාලන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී ස්ථිරවම රට හැර යන පුද්ගලයින් හඳුනා ගැනීම සහ ඔවුන් විසින් රටින් බැහැරට ගෙන යන විදේශ විනිමය ප්‍රමාණය නිශ්චය කර බදු පැහැදම වැඩි කර ගැනීමේ යාන්ත්‍රණයක් හෝ ක්‍රමවේදයක් සකස් කර ගැනීම කෙරෙහි දෙපාර්තමේන්තුව අවධානය යොමුකර නොතිබුණි.

(iv) 2015 අංක 10 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව වාහන ආනයන කරුවන්ගෙන් බලපත්‍ර ගාස්තුවක් අය කිරීම හඳුන්වා දී තිබුණි. 2016 වාර්ෂික අයවැය යෝජනා අනුව යථෝක්ත පනතට සිදුකරන සංශෝධනයන්ට යටත්ව 2016 ජනවාරි 01 දින සිට වාහන ආනයනකරුවන්ගේ බලපත්‍ර ගාස්තුව වෙනුවට වාහන හිමිකම් බද්දක්, වාහන ආනයනකරනු ලබන පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණ අතර එය අයකිරීමේ බලය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත පවරා තිබුණි. එමෙන්ම, වාහන ආනයන කිරීම සඳහා ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේදී මෙම බදු මුදල අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට දෙපාර්තමේන්තුව විසින් බැංකු වෙත උපදෙස් ලබාදී තිබුණි. ඒ අනුව, වාහන හිමිකම් බද්ද ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන157.91 ක මුදලක් රැස් කර තිබුණ ද 2015 අංක 10 දරන මුදල් පනතට අදාළ සංශෝධන සිදුකර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුල ආනයනයකළ වාහන සංඛ්‍යාව සම්බන්ධව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු හා වාහන හිමිකම් බදු අනු ප්‍රමාණ පදනම් කර ගෙන සිදු කළ ගණනය කිරීමේ දී, මෙම බද්ද බැංකු මගින් අයකිරීම වෙනුවට රේගු දෙපාර්තමේන්තුව මගින් අයකළේ නම් වාහන හිමිකම් බද්ද ලෙස රු.මිලියන 2,427.11 ක පමණ මුදලක් අය කර ගැනීමේ හැකියාව පැවති බව නිරීක්ෂණය විය.

(ඊ) 2016 වර්ෂයේ අය වැය යෝජනා අනුව, මත් පැන්, දුම්කොල සහ ඔට්ටු හා සූදු මතවන ආදායම් බද්දෙන් සියයට 25 ක අධිභාරයක් පැනවීමට යෝජනා කර තිබුණ අතර ඒ තුලින් රු.මිලියන 2,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. එහෙත් අදාළ පනත් සංශෝධනය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී අධිභාර බදු ආදායම රැස්කර නොතිබුණි.

(උ) රේගු දෙපාර්තමේන්තුව විසින් රැස්කළ එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වලින් පිළිවෙළින් රු.මිලියන 2.28 ක් හා රු.මිලියන10,066.55 ක් බදු කරුවන් වෙත ආපසු ගෙවා තිබුණි. එහෙත් ඊට අදාළ ලේඛන වාර්තා හෝ තහවුරු කිරීම් රේගු දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා ගෙන ආදායමින් ආපසු ගෙවූ මුදලේ නිවැරදි බව තහවුරු කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 24601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2012 සැප්තැම්බර් 18 දින මියගොස් තිබුණු නිලධාරිණියකගෙන් අය විය යුතුව පැවති රු.191,514 ක් වූ දේපළ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය වී නොතිබුණි.

(ආ) 1999 වර්ෂයේ දී සේවය හැර ගොස් සිටි සේවකයෙකුගෙන් අය විය යුතු රු. 252,045 ක් වූ දේපළ ණය මුදල ඔහු සේවයේ යෙදී සිටිය දී ඔහුගේ නමට ඉඩමේ ඔප්පුව ලිවීමට කටයුතු කර ඇටෝනි බලය පවරාගෙන නොතිබීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට වසර 20 ක් ඉක්මවා ඇති රු.230,534 ක් වූ අය කරගත නොහැකි වූ ණය ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 110 අනුව ක්‍රියා කර නොතිබිණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 11.14 වගන්තිය ප්‍රකාරව දේපළ ණය ලබා දීමේ දී ඒවාට අදාළව සුරැකුම් ලෙස නිලධාරීන් ගෙන් ලබාගත් ඔප්පු හා ඇටෝනි බලය පැවරූ ලියවිලිවල ආරක්ෂාව සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පියවරයන් ගත යුතුය. එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් සේප්පුවක තැන්පත් කර ඇතිබව දක්වා ඇති ඔප්පු 47 ක් සේප්පුව තුල නොතිබුණ බව නියැදි විගණන පරික්ෂාවේදී නිරීක්ෂණය විය. ණය මුදල් ගෙවා අවසන් බැවින් එම ලියකියවිලි අදාළ නිලධාරීන් වෙත භාර දී ඇති බව දෙපාර්තමේන්තුව විසින් වාර්තා කර තිබුණි. කෙසේ වුවද එම නිලධාරීන් ණය මුදල් ගෙවා අවසන් කර ඇති බවට හෝ එම නිලධාරීන් විසින් ආපසු ඔප්පු භාර ගත් බවට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණ ද සැලසුම් ගත පරිදි නියමිත කාල සීමාවල දී ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබුණ අවස්ථා පැවති බව නියැදි විගණන පරික්ෂාවේදී නිරීක්ෂණය විය. ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා ස්කෑනර් යන්ත්‍ර 4 ක් සහ පරිගණක යන්ත්‍ර 500 ක් මිල දී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු නිදසුන් ලෙස දැක්විය හැක. ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂණවල දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් පරිපාලන කළමනාකරණ පද්ධතිය (RAMIS) මඟින් බදු කරුවන් ලියාපදිංචිය හා බදු වාර්තා භාර ගැනීම සමාලෝචිත වර්ෂයේ දී ආරම්භ කර තිබුණ අතර එම කටයුතු සඳහා පරිගණක 500 ක් කඩිනමින් මිලදී ගැනීමට දෙපාර්තමේන්තුව විසින් තීරණය කර තිබුණි. ඒ සඳහා වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් භාණ්ඩාගාරයෙන් රු.මිලියන 50 ක අතිරේක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ප්‍රසම්පාදන කටයුතු නිමකිරීමට කටයුතුකර නොතිබුණි. ඒ හේතුවෙන් නිලධාරීන්ට පවරා තිබුණු වැඩ අයිතම (Work Items) 56,400 ක පමණ ප්‍රමාණයක් නිම කිරීමට හැකිවී නොතිබුණි.

(ආ) 2016 අගෝස්තු මාසයේ සිට වසර 3 ක කාලයක් සඳහා දෙපාර්තමේන්තුවේ දඹුල්ල ප්‍රදේශීය කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා රු.320,000 ක මාසික කුලී පදනම මත ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණද එම ගොඩනැගිල්ල නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවූ එකක් බව නිරීක්ෂණය විය.

**3.7 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය වත්කම්**

පහත වර්ගකර ඇති වත්කම් නිෂ්ක්‍රීයව පැවතිබව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| (i) ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර | 02 | 2009 වර්ෂයේ සිට විගණන දිනය වූ 2017 ජූලි 31 දින දක්වා (දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයේ දී සපයා තිබුණි.) |
| (ii) සී.සී.ටී.වී. කැමරා | 70 | 2010 වර්ෂයේ සිට විගණන දිනය වූ 2017 ජූලි 31 දින දක්වා (දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයේ දී ගොඩනැගිල්ලේ මහල්වලට සවි කර ඇති නමුත් ඒවා භාවිතයට ගෙන නොතිබුණි.) |

**(ආ) ලැබිය යුතු ශේෂ**

කොළඹ 12 ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් ඉඩමේ පර්චස් 100 ක ඉඩම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සඳහා 2008 පෙබරවාරි 28 දින රු.මිලියන 50 ක් ගෙවා තිබුණ ද පසුව එම දේපළ පවරා ගැනීම අත්හැර තිබුණි. එහෙත් ඒ සඳහා ගෙවූ අත්තිකාරම් මුදල් 2017 ඔක්තෝබර් 24 දින වනවිටත් ආපසු අය කර ගෙන නොතිබුණි.

**3.8 ආදායම් පරිපාලන කළමනාකරණ පද්ධතියේ (RAMIS) කාර්යසාධනය**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාපිත ආදායම් බදු, එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළු බදු වර්ග කීපයක පරිපාලන කටයුතු RAMIS පද්ධතිය යටතේ සිදුකිරීම ආරම්භ කර තිබුණු අතර එහි ක්‍රියාකාරීත්වයට අදාළ ව සිදුකළ නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ කරුණු පහත වේ.

(අ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත, 2006 අංක 10 දේශීය ආදායම් පනත සහ 2009 අංක 9 දරන බදු පනත්වල විධිවිධාන ප්‍රකාරව බදු කරුවන් විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත්කළ යුතුව පැවති එකතු කල අගය මත බදු, සංස්ථාපිත ආදායම් බදු, රඳවා ගැනීමේ බදු, උපයන විට ගෙවීමේ බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු යන බදු වර්ගයන්ට අදාළව බදු වාර්තා 66,001 ක් පමණ 2016 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර

නොතිබුණි. බදු කරුවන් විසින් අදාළ වාර්තා ඉදිරිපත් කර නොමැති අවස්ථාවල 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ III වන පරිච්ඡේදයේ 21 වගන්තිය, 2006 අංක 10 දේශීය ආදායම් පනතේ XXIX පරිච්ඡේදයේ 202 වගන්තිය සහ 2009 අංක 9 දරන බදු පනතේ 8 වන වගන්තිය යන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව අදාළ බදු කරුවන්ට විරුද්ධව නීත්‍යානුකූල පියවර ගැනීම සිදුකළ යුතු වුවත් 2017 ඔක්තෝබර් 24 දින වනවිටත් එසේ කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වාර්තා භාර ගැනීම සහ වාර්තා මත බදු මුදල් භාර ගැනීම පද්ධතිය හරහා සිදුකර තිබුණද ඇතැම් බදු කරුවන්, පනත්වල විධිවිධානවලට පටහැනිව නියමිත දිනට පසුව බදු මුදල් ගෙවා තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. පනතෙහි විධිවිධාන ප්‍රකාරව බදු මුදල් ගෙවීමේ ප්‍රමාදය මත බදු කරුවන්ගෙන් දඩ මුදල් අයකළ යුතු වුවත් එසේ දඩ මුදල් අය කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. විගණනයේ දී සිදු කළ ගණනය කිරීම අනුව, එසේ අය කළ බව තහවුරු නොවූ එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදුවලට අදාළ දඩ මුදල පිළිවෙළින් රු.මිලියන 503.3 ක් හා රු.මිලියන134.8 ක් විය.

(ඇ) බදු පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) යටතේ පාලනය වන බදු වර්ග සඳහා බදුකරුවන් ඉදිරිපත් කරන තොරතුරු හා වාර්තා සම්බන්ධයෙන් පද්ධතිය විසින් හඳුනා ගන්නා ලද අඩුපාඩු සහ තවදුරටත් පරීක්ෂා කළ යුතු කරුණුවලට අදාළ වැඩ විෂයයන් පද්ධතිය විසින්ම නිලධාරීන් වෙත යොමු කරනු ලබයි. එහෙත් සමාලෝචිත වර්ෂය තුල එසේ නිලධාරීන් වෙත යොමු කර තිබුණු වැඩ විෂයයන් 56,418 ක් නියමිත පරිදි නිම නොකිරීම හේතුවෙන් පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණ බව විගණනයේදී නිරීක්ෂණය වීය. නිම කර නොමැති වැඩ විෂයයන් අතරින් විෂයයන් 25,565 ක් එකතු කළ අගය මත බදු සඳහා ද, වැඩ විෂයයන් 19,356 ක් සංස්ථාපිත ආදායම් බදු සඳහාද වන බව විගණනට අනාවරණය විය. මෙසේ වැඩ විෂයයන් නිම නොකිරීම හේතුවෙන් පරිගණක පද්ධතියේ කටයුතුද කාලීනව සිදුනොවන බව නිරීක්ෂණය විය.

**3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවල දී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) එකතු කිරීමේ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු සම්බන්ධයෙන් බදුකරුවන් විසින් ඉදිරිපත් කළ බදු වාර්තා මත මුදල් ගෙවා නොතිබුණ අවස්ථාවලදී පරිගණක පද්ධතිය ඇසුරින් ස්වයංක්‍රීයව හිඟ බදු සහ ඒවාට අදාළ දඩ මුදල් ගණනය කර වාර්තා කිරීමේ ක්‍රමවේදයක් 2012 මාර්තු 31 දක්වා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබුණ ද 2012 අප්‍රේල් 01 දින සිට එම ක්‍රමවේදය නතර කර තිබුණි. ඒ හේතුවෙන් එකතු කළ අගය මත බද්දට සහ ජාතිය ගොඩනැගීමේ බද්දට අදාළ ව 2012 අප්‍රේල් 01 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා වූ බදු කාල පරිච්ඡේදය තුල බදු කරුවන් විසින් ඉදිරිපත් කළ එකතුව රු.මිලියන 15,283.31 ක බදු වාර්තා සඳහා මුදල් ගෙවා නොතිබුණද ඊට අදාළ ව තක්සේරු වාර්තා නිකුත් වී නොතිබුණි. ඒ අනුව මෙම හිඟ බදු මුදල හා ඒ මත ගණනය කළ රු.මිලියන 9,237.67 ක දඩ මුදල ද වශයෙන් එකතුව රු.මිලියන 24,520.98 ක හිඟ ශේෂයක් 2016 දෙසැම්බර් 31 දිනටත් දෙපාර්තමේන්තුව විසින් අය කර ගෙන තිබුණ බව විගණනයට තහවුරු නොවූ අතර ඒවා හිඟ බදු ලෙස වාර්තා කිරීමට ද දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව පැහැර හරින ලද බදු මුදල්, මහේස්ත්‍රාත්වරයෙකුගේ තීරණය මත පමණක් වාරික වශයෙන් අයකර ගැනීමේ හැකියාව ඇත. එහෙත් ඊට පටහැනිව

2016 මැයි මාසය වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අංශ හා ප්‍රාදේශීය කාර්යාල 35 ක් විසින් රු.මිලියන 8,914 ක හිඟ බදු මුදල් වාරික වශයෙන් ගෙවීම සඳහා බදුකරුවන් 918 දෙනෙකුට ඉඩ සලසා දී තිබුණි. මෙසේ රාජ්‍ය ආදායම කාලීනව එක්රැස් නොකිරීම රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අහිතකර ලෙස බලපාන බව නිරීක්ෂණය කෙරේ.

## 3.10 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට වාර්ෂිකව සැපිරිය යුතු අතිරේක බදු රැස් කිරීමේ ඉලක්ක ලබා දී තිබුණද ඇතැම් නිලධාරීන් නියමිත ඉලක්ක සපුරා නොමැති බව අදාළ වාර්තා අනුව තහවුරු විය. මෙම ඉලක්කයන් දෙපාර්තමේන්තුවේ දිරි දීමනා යෝජනා ක්‍රමය සඳහා ද ප්‍රධාන වශයෙන් පාදක කර ගෙන තිබුණි. 2014 , 2015 සහ 2016 වර්ෂ වලට අදාළව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී එසේ සම්පූර්ණ නොකළ ඉලක්කවල වටිනාකම හෙවත් අතිරේක බදු ලෙස රාජ්‍ය ආදායමට එකතු නොවූ මුදල රු.මිලියන 4,652 ක් විය. කෙසේ වුවද නිලධාරීන් දිරි දීමනා ලබා ගැනීමේ දී මෙම ඉලක්ක සම්පූර්ණ කර ඇති බව වාර්තා කර දිරි දීමනා ද ලබා ගෙන තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ දත්ත වෙනස් කර රු.මිලියන 129.03 ක පමණ මුදලක් වංචා කර ඇති බව දෙපාර්තමේන්තුව විසින්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර තිබුණි. එසේම ඊට අදාළව පරිගණක පද්ධතියේ උපස්ථම්භක ගොනු පරික්ෂා කර වාර්තාවක් සපයන ලෙසට කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන ආයතනය වෙත 2013 වර්ෂයේ දී අධිකරණය විසින් නියෝගයක් ලබා දී තිබුණි. ඒ අනුව, අදාළ කාර්යය ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පරිගණක අධ්‍යයන ආයතනය වෙත රු.මිලියන 1.4 ක් ගෙවා තිබුණ ද අධිකරණ නියෝගය අනුව මූල්‍ය වංචාව අනාවරණය කර ගැනීම සඳහා අවශ්‍ය වාර්තාව ලබා දීමට කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන ආයතනය අපොහොසත් වීම හේතුවෙන් ගෙවූ මුදල් අනාර්ථික වියදමක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මූල්‍ය වංචාවට අදාළ පරීක්ෂණ කටයුතු නිම වී නොතිබුණි.

## 3.11 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාල ව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමු ගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 3.7 | දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණය කිරීමට හා මහල් නවයකින් සමන්විත රථ වාහන අංගනයක ඉදි කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණු රු.මිලියන 1,437 ක මුදලකින් රු.මිලියන 1,318 ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවා තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට පෙර එම ඉදිකිරීම අවසන් කළ යුතුව තිබුණත්, 2017 ජුනි 30 දින වන විටත් එම ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. |

## 3.12 කළමනාකරණ දූර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) බදුකරුවන් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබාදෙනු ලබන චෙක්පත් අගරු වීමේ ප්‍රවණතාව වාර්ෂිකව ඉහළයමින් පැවතියද එය නිවැරදි කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අගරු වූ චෙක්පත් සඳහා මුදල් අය කර ගැනීමේදී ද මන්දගාමී ස්වරූපයෙන් කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. 2016 දෙසැම්බර් 31 වන දිනට මෙලෙස අගරු වී පැවති චෙක්පත් සංඛ්‍යාව 5,936 ක් වූ අතර ඒවායේ වටිනාකම රු.මිලියන 1,976 ක් විය.

(ආ) දෙපාර්තමේන්තුවේ නීති අංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, බදු පනත්වල විධිවිධාන ප්‍රකාරව 2016 මැයි 30 දිනට හිඟ බදු අයකර ගැනීම සඳහා අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන ඇති නඩු 367 ක් පවතින බව වාර්තා කර තිබුණි. එහෙත් දෙපාර්තමේන්තුවේ විවිධ අංශ සහ ප්‍රාදේශීය කාර්යාල 36 කින් විගණනයට ලබා දුන් තොරතුරු අනුව එම සංඛ්‍යාව 1,520 ක් විය. ඒ අනුව, දෙපාර්තමේන්තුව තුල නීති අංශයක් වෙනමම ස්ථාපිතව පැවතිය ද එම අංශය මඟින් ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල පවතින හිඟ බදුවලට අදාළ නඩු පිළිබඳව සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් පියවරක් ගෙන නොතිබුණි. මේ හේතුවෙන් පවරා ඇති ඇතැම් නඩු විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කර පවරා ඇති බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි නීති අංශය තුල නො වීය. තවද, ප්‍රාදේශීය කාර්යාල විසින් පවරා ඇති බවට වාර්තා කර ඇති ඇතැම් නඩු තථ්‍ය වශයෙන්ම පැවරූ නඩු බවටද සාක්ෂි නීති අංශය තුල නොවීය. ලබා දී ඇති නඩු තීන්දු අනුව, හිඟ බදු මුදල් නියමානුකූලව අදාළ පාර්ශවයන් විසින් ගෙවන්නේද යන්න පිළිබඳ පසු විපරම් කටයුතුද නීති අංශය විසින් මෙහෙයවා නොතිබුණි. ලබාගත හැකි වූ තොරතුරු අනුව, එසේ පවරා ඇති නඩු 413 කට අදාළ ව පමණක් අයවිය යුතුව පැවති හිඟ බදු මුදල් ප්‍රමාණය රු.මිලියන 1,771 ක් විය.

(ඇ) දෙපාර්තමේන්තුව වෙත ලැබෙන බදු අභියාචනා සම්බන්ධයෙන් කඩිනම් පියවර නොගැනීම නිසා රජයට ලැබිය යුතු බදු ආදායම් කාලීනව නොලැබෙන බවත් එය බදුකරුවන්ගේ පාර්ශවය අනුව වාසි සහගත තත්ත්වයක් බවත් නිරීක්ෂණය වේ. දෙපාර්තමේන්තුව යටතේ ඇති මහ පරිමාණ බදු ගෙවන්නන්ගේ අංශ 6 සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී විගණනයට ලබා දුන් තොරතුරු අනුව නිරීක්ෂණය වූයේ 2012/13 තක්සේරු වර්ෂයේ සිට 2014/15 දක්වා වූ තක්සේරු වර්ෂ 3 කට අදාළව ආදායම් බදු, එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු සඳහා නිකුත් කළ අතිරේක තක්සේරු සම්බන්ධයෙන් ලැබී ඇති බදු අභියාචනා 594 කින් 9 ක් පමණක් විසඳා ඇති බවයි. ලබාගත හැකි වූ තොරතුරු අනුව, ලැබී ඇති අභියාචනාවල වටිනාකම රු.මිලියන 53,804 ක් වූ අතර විසඳා ඇති අභියාචනාවල වටිනාකම රු.මිලියන 67 ක් විය. විසඳී නොමැති බදු අභියාචනා අතරින් තක්සේරු වටිනාකම රු.මිලියන 47,457 ක් වූ අභියාචනා 427 ක් මහා පරිමාණ බදු ගෙවන්නන්ගේ අභියාචනා අංශයේ පැවති අතර තක්සේරු වටිනාකම රු.මිලියන 5,476 ක් වූ අභියාචනා 63 ක් කොමසාරිස් ජනරාල් යටතේ විසඳීමට පැවති බව තවදුරටත් අනාවරණය විය.

(ඈ) රාජ්‍ය ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් වාර්ෂිකව ඉදිරිපත් කෙරෙන අයවැය යෝජනා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ප්‍රමාණවත් මට්ටමක නොමැති බව නිරීක්ෂණය විය. 2016 වර්ෂයේ දී රාජ්‍ය ආදායම වර්ධනය කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් අයවැය යෝජනා 18 ක් ඉදිරිපත්ව තිබුණ ද එයින් ක්‍රියාත්මක මට්ටමක පැවතියේ යෝජනා 4 ක් පමණි. ඒ අනුව, යෝජිත ආදායම් ඉලක්ක සපුරා ගැනීමේ දී වාර්ෂික අයවැය යෝජනා මඟින් ප්‍රමාණවත් දායකත්වයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(ඉ) 2010 අංක 16 දරණ ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ප්‍රකාරව 2009 දෙසැම්බර් 31 දිනට ගෙවීම් පැහැර හැර තිබුණු රු.මිලියන125,206 ක බදු මුදලක් නිරවුල් කිරීම සඳහා ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු අය කර ගැනීමේ අංශය නමින් නව අංශයක් ස්ථාපිත කර එම අංශය වෙත මාරු කර තිබුණි. තවද, 2014 අංක 14 දරණ ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) සංශෝධන පනත මඟින් මෙම හිඟ බදු අය කර ගැනීම සඳහා වූ අතිරේක විධිවිධාන සලසා දී තිබුණ ද 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 82,971 ක හිඟ බදු මුදලක් පමණක් එමගින් නිරවුල් කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබුණි. තවදුරටත් අය කර ගත යුතුව පැවති ශේෂය රු.මිලියන 42,235 ක් විය. තවද, පනතේ විධිවිධාන ප්‍රකාරව බදු කරුවන් 4 දෙනෙකු ගෙන් අය විය යුතුව පැවති රු.මිලියන 365 ක හිඟ බදු මුදලක් වාරික වශයෙන් ගෙවීම සඳහා 2013 වර්ෂයේ දී අවසර ලබා දී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදලින් රු.මිලියන 6 ක් පමණක් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී මන්දගාමීව කටයුතු කරන බව නිරීක්ෂණය විය.

(ඊ) ප්‍රාදේශීය කාර්යාල නවීකරණය කිරීමෙන් හා අලුත්වැඩියාවන් සිදුකිරීමෙන් ඒවායේ යටිතල පහසුකම් සංවර්ධනයකර ආදායම් උත්පාදනය මාර්ග ඉහළ නැංවීම දෙපාර්තමේන්තුවේ මූලික අරමුණක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල නවීකරණය හා අලුත්වැඩියාව සඳහා රු.මිලියන 40 ක මුදලක් වෙන් කරවා ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ප්‍රතිපාදන වලින් රු.මිලියන 22 ක් වැය කර නොතිබුණි. ඉකුත් වර්ෂවලදීද මෙලෙස ප්‍රතිපාදන ඉතිරිවීම් වාර්තා වීම හේතුවෙන් දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ප්‍රතිපාදන වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(උ) එකතු කළ අගය මත බදු අයකළ හැකි සීමාව 2013 ජනවාරි 01 දින සිට, කාර්තුවකට රු.මිලියන 3.75 හෝ වර්ෂයකට රු. මිලියන 15 ක් දක්වා ඉහළ දමා තිබුණි. එසේ බදු සීමාව ඉහළ දැමීමත් සමඟ බදු කරුවන් 17,000 කට අධික සංඛ්‍යාවක් බදු පැහැදමින් ඉවත් කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණ අතර අදාළ එම බදු ලිපි ගොනු ද තාවකාලිකව අක්‍රිය කර තිබුණි. එහෙත් එම බදුකරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කර ඒ වනවිට නිකුත් කර තිබුණු එකතු කිරීමේ අගය මත බදු ලියාපදිංචි සහතික නැවත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ පරිදි එසේ අක්‍රිය කළ බදුකරුවන් 27 දෙනෙකු ගෙන් හා රාජ්‍ය ආයතන 10 කින් රු.මිලියන 7.55 ක පමණ එකතු කළ අගය මත බදු මුදලක් රැස් කර තිබුණ ද, බදු වාර්තා ඉදිරිපත් කිරීමක් හෝ දෙපාර්තමේන්තුව වෙත බදු මුදල් ප්‍රේෂණය කිරීමක් හෝ සිදු කර නොතිබුණි.

(ඌ) විවිධ ක්‍රමවේදයන්ගෙන් දෙපාර්තමේන්තුව විසින් රැස් කර ගන්නා ලද තොරතුරු අනුව, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 106(7) වගන්තිය ප්‍රකාරව පුද්ගලයින් හා ආයතන වෙතින් වාර්තා කැඳවා එම වාර්තාවල තොරතුරු මත නව බදු ලිපි ගොනු විවෘත කර බදු පැහැදම පුළුල් කිරීම හා බදු ආදායම ඉහළ නංවා ගැනීම දෙපාර්තමේන්තුවේ එක් අරමුණක් වී තිබුණි. එම කාර්යය ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව තුල තොරතුරු අංශයක් ද ස්ථාපිත කර තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුර අනුව, 2015 වර්ෂයේ දී "1 වී වාර්තා" (1 V Return) 33,139 ක් විවිධ පුද්ගලයන් හා ආයතන වෙත යවා තිබුණ ද ඉන් වාර්තා 20,665 ක් පමණක් දෙපාර්තමේන්තුවට ආපසු ලැබී තිබුණි. ඒ අනුව, වාර්තා 12,474 ක් දෙපාර්තමේන්තුවට ආපසු ලැබී නොතිබුණු අතර එසේ ලැබී නොමැති වාර්තා සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව කාලීනව කටයුතු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. එමෙන්ම තොරතුරු අංශයට ලැබුණ "1 වී වාර්තා" දෙපාර්තමේන්තුවේ වෙනත් අංශ හා ප්‍රාදේශීය කාර්යාල වෙත බෙදාහැර තිබුණද එම තොරතුරු පදනම් කර ගෙන ප්‍රාදේශීය කාර්යාල විසින් අලුතින් බදු ලිපි ගොනු විවෘත

කර තිබුණේද යන්න සොයා බැලීමේ ක්‍රම වේදයක් දෙපාර්තමේන්තුවේ තොරතුරු අංශය තුළ නොවීය.

## 3.13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

(අ) 2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 1247 | 1194 | 53 | |
| (ii) තෘතීය මට්ටම | 36 | 30 | 06 | - |
| (iii) ද්විතීය මට්ටම | 1055 | 906 | 149 | - |
| (iv) ප්‍රාථමික මට්ටම | 437 | 410 | 27 | - |
| (v) වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| එකතුව | 2775 | 2542 | 235 | 02 |

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 235 ක් වූ අතර ඉන් දේශීය ආදායම් සේවයේ නිලධාරීන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව 53 ක් විය. එමෙන්ම සහාය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 182 ක් විය. දේශීය ආදායම් සේවයේ නිලධාරීන් හට පරීක්ෂණ කටයුතු සඳහා බදු ලිපි ගොනු වෙන් කර දී තිබුණ අතර නිලධාරියා විසින් ඒවායේ විගණන කටයුතු සහ ලබා දී ඇති ඉලක්ක අනුව අතිරේක බදු රැස් කිරීම කළ යුතු විය. ඒ අනුව නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම, අතිරේක බදු ආදායම් රැස් කිරීමට ඍජු බලපෑමක් ඇති කරන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී දේශීය ආදායම් සේවයේ නිලධාරීන්ගෙන් සියයට 63 ක් ප්‍රධාන කාර්යාලයට ද ඉතිරි සියයට 37 ප්‍රාදේශීය කාර්යාලවලට ද අනුයුක්ත කර තිබුණි. එහෙත් දෙපාර්තමේන්තුව විසින් උපයා ඇති මුළු ආදායමෙන් සියයට 96 ක් ප්‍රධාන කාර්යාලයේ විවිධ අංශවලට අනුයුක්ත නිලධාරීන් රැස් කර තිබුණ ද ප්‍රාදේශීය කාර්යාලවලින් රැස් කර තිබුණේ සියයට 4 ක් පමණි. ඒ අනුව දේශීය ආදායම් සේවයේ නිලධාරීන් විවිධ අංශවලට අනුයුක්ත කිරීම

ආදායම් රැස් කිරීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගෙන සිදු කර ඇති බවක් විගණනයේ දී නිරීක්ෂණය නොවිය.

(ඈ) මහා පරිමාණ බදු ගෙවන්නන් සඳහා වූ අංශ තුනක් යටතේ පැවති බදු ලිපි ගොනු සංඛ්‍යාව සහ ඒවා පරීක්ෂා කිරීම සඳහා අනුයුක්ත කර ඇති දේශීය ආදායම් සේවයේ නිලධාරීන් සංඛ්‍යාව සම්බන්ධයෙන් 2014 හා 2015 වර්ෂවලට අදාළ දත්ත සමහරක් පහත දැක්වේ.

| අංශය | බදු ලිපි ගොනු බෙදා දී ඇති නිලධාරීන් සංඛ්‍යාව | අංශයේ පැවති බදු ලිපි ගොනු සංඛ්‍යාව | 2014 හා 2015 වර්ෂයේ පෙර බදු වාර්තා කිරීම සඳහා විගණනය කළ ගොනු සංඛ්‍යාව | 2014 හා 2015 වර්ෂවල වාර්තා කළ පෙර බදු මුදල |
|---|---|---|---|---|
| | | | | රු.මිලියන |
| 8 අංශය | 11 | 450 | 172 | 3,880.16 |
| 6A අංශය | 10 | 409 | 126 | 2,751.08 |
| 6C අංශය | 15 | 567 | 131 | 18,696.54 |
| **එකතුව** | **36** | **1426** | **429** | **25,327.78** |

ඉහත දත්ත අනුව, අංශ 3 ක් තුල බදු ලිපි ගොනු 1,426 පැවති අතර ඒවා විගණනය කිරීම සඳහා නිලධාරීන් 36 දෙනෙකු වෙත පවරා තිබුණි. ඒ අනුව, එක් නිලධාරියෙකු වෙත දළ වශයෙන් බදු ලිපි ගොනු 40 ක පමණ විගණන කටයුතු පැවරී තිබුණි. එහෙත් අදාළ වර්ෂ දෙකක කාලය තුල එක් නිලධාරියෙකු විසින් දළ වශයෙන් බදු ලිපි ගොනු 12 ක් පමණ විගණනය කර බදු ලිපි ගොනු 429 ක් තුලින් රු.මිලියන 25,327.78 ක අතිරේක බදු හා දඩ මුදල් රැස් කර තිබුණ බව වාර්තා වී තිබුණි. ඒ අනුව, මෙවැනි මහා පරිමාණ බදු ගෙවන අංශවල බදු ලිපි ගොනු වැඩි සංඛ්‍යාවක් විගණනයට ලක් වන පරිදි නිලධාරීන් අනුයුක්ත කර අතිරේක බදු ආදායම ඉහළ නංවා ගැනීමට දෙපාර්තමේන්තුවේ ප්‍රමාණවත් අවධානයක් යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය.